රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනවල/
බාහිරඅයදුම්කරුවන් සඳහා

අවසන් දිනය – **2026.02.06**

# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මතු සඳහන් ව්‍යාපෘතිවල **ව්‍යාපෘති අභ්‍යන්තර විගණක** තනතුර සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් ද ඇතුළු ව සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පත්වීම් 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධානවලට යටත් වනු ඇත.

| **ව්‍යාපෘතියේ නම** | **පුරප්පාඩු ගණන** | **ව්‍යාපෘති අගය (ඇ.ඩො. මිලියන)** | **තනතුර** |
|---|---|---|---|
| බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 01 | ඇමෙරිකානු ඩොලර් මිලියන ( 15 - 50) කාණ්ඩය | ව්‍යාපෘති අභ්‍යන්තර විගණක |
| විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) | 01 | ඇමෙරිකානු ඩොලර් මිලියන (50 - 100) කාණ්ඩය | |
| **අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියේ (ICDP)** | 01 | ඇමෙරිකානු ඩොලර් මිලියන (100-250) කාණ්ඩය | |

**<u>යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019, ඇමුණුම 01 අනුව, අභ්‍යන්තර විගණක (PS04) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත</u>**

| **මූලික අධ්‍යාපන සුදුසුකම්** | **ව්‍යාපෘති අගය අනුව සුදුසුකම් ලැබීමෙන් පසුව තිබිය යුතු පළපුරුද්දේ ස්වභාවය** | | |
|---|---|---|---|
| **පහත (1) හෝ (2)** | **ඇමෙරිකානු ඩොලර් මිලියන (15 - 50) කාණ්ඩය** | **ඇමෙරිකානු ඩොලර් මිලියන (50 - 100) කාණ්ඩය** | **ඇමෙරිකානු ඩොලර් මිලියන (100-250) කාණ්ඩය** |
| **01)**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් | සමග<br>එම සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද | සමග<br>එම සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද | සමග<br>එම සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද |

| | | | |
|---|---|---|---|
| **02.** දිප ව්‍යාප්ත සේවාවල III/II පන්තියේ හෝ ඊට වැඩි හෝ සමාන තත්ත්වයක අදාළ ක්ෂේත්‍රයේ සිටින රජයේ නිලධරයකු වීම | සමග<br>III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද | සමග<br>III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද | සමග<br>III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද |

---

සටහන-

අදාළ ක්ෂේත්‍රය යන්නෙන් අදහස් වන්නේ "විගණන ක්ෂේත්‍රය" වන අතර, පළපුරුද්ද ද අදාළ ක්ෂේත්‍රයේ ම පැවතිය යුතු ය.

---

**සාමාන්‍ය කොන්දේසි:**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම් පත් යොමු කළ යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා වයස 60ට අඩු
- අනෙකුත් අයදුම්කරුවන් සඳහා වයස 64ට අඩු

**02** වැටුප:

- මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම් ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.
- අයදුම්කරු දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.
- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ දී ඇති අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.
- පත්වීම ප්‍රදානය කිරීමේ තීරණය සහ සේවා දිගු ලබා දීම චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදය ප්‍රකාරව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ

පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ අනුලේඛනය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද ඇතුළත්ව 2026.02.06 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ **ලේකම්, ප්‍රවාහන,මහාමාර්ග හා නාරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර" , අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**

**07.** **වැඩිදුර විමසීම් සඳහා**
0112271048

**08.** **සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවක සිංහල භාෂා පාඨය බලපැවැත් වේ.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම

**ලේකම්**
**ප්‍රවාහන,මහාමාර්ග හා නාරික සංවර්ධන අමාත්‍යාංශය**